**උඩුබද්දාව ප්‍රාදේශීය සභාව.**
**කුරුණෑගල දිස්ත්‍රික්කය.**

## 1. මූල්‍ය ප්‍රකාශන

## 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 මාර්තු 29 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව සහ විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 මැයි 31 දින සභාපතිවරයාට යවා ඇත.

## 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට උඩුබද්දාව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ ගෙවීම් කර තිබූ රු.82,737 ක රඳවුම් මුදල ජංගම වගකීම් යටතේ සටහන් කර තිබුණි. | නිවැරදි කළ යුතු වේ. | එම වටිනාකම 2019 අවසන් ගිණුම තුළින් ඉවත් කිරිමට කටයුතු කරන බව දන්වමි. |
| (ආ) | ගිණුම් ශේෂයන් 04 කට අදාළව මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂය හා උපලේඛන අනුව ශේෂයන් අතර රු.5,779,257 ක් වෙනසක් විය. | අදාළ ශේෂ වල වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුවේ. | වෙනස්කම් සොයා බලා එම ශේෂ නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ඇ) | වටිනාකම රු. 136,557,398 ක් වූ ගිණුම් ශේෂයන් 03 කට අදාළව සාක්ෂි ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේ දී ඒවා සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය. | මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතුවේ. | ඉදිරියේ දී ලේඛන නිවැරදි කරමි. |

**1.4 අනුකූල නොවීම්**

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 154(1) වගන්තිය | ඉඩම් කට්ටි කර විකිණීමේදී විකුණුම් මිලෙන් සියයට 1 ක් අයකර ගත යුතු වුවද, ඇස්තමේන්තුගත විකුණුම් මිලෙන් සියයට 1 ක් පමණක් අයකරගෙන තිබුණි. | නීති,රීති රෙගුලාසිවලට අනුකූලව කටයුතු කළ යුතුවේ. | පසුව විකුණුම් විස්තරවලට අදාලව හිඟ බදු මුදල් ගෙවන ලෙස සමාගම් දැනුවත් කිරීමට කටයුතු කරන බව දන්වමි. |
| (ආ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය පරිපාලන) රීති රීති 218 | සභාවේ සියලු ඉඩම් හා ගොඩනැගිලි වර්ෂයකට වරක් හෝ පරීක්ෂා කිරීම සිදුකර නොතිබුණි. | රීති වලට අනුකූලව කටයුතු කළ යුතුවේ. | ඉඩම් ගොඩනැගිලි ක්ෂේත්‍රය සඳහා සමීක්ෂණ මණ්ඩලයක් මේ වන විට පත්කර ඇති අතර, සමීක්ෂණයන්ගෙන් පසු ලබාගන්නා නිවැරදි දත්ත අනුව ඉඩම් හා ගොඩනැගිල ලේඛන නිවැරදි කිරීමට කටයුතු කරමි. |

**02. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.27,297,032 ක් වූඅතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.33,295,405 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2018 වර්ෂය | | | | 2017 වර්ෂය | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | | ඇස්තමේන්තුගත ආදායම් | බිල්කළ ආදායම් | රැස්කළ ආදායම් | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම් | බිල්කළ ආදායම් | රැස්කළ ආදායම් | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| I. | වරිපනම් හා බදු | 3,826 | 4,244 | 3,984 | 2,208 | 3,391 | 4,481 | 3,888 | 1,838 |
| II. | බදු කුලී | 12,766 | 11,820 | 12,681 | 26 | 11,600 | 10,556 | 10,492 | 137 |
| III. | බලපත්‍ර ගාස්තු | 748 | 800 | 800 | - | 768 | 567 | 567 | - |
| IV. | වෙනත් ආදායම් | 18,629 | 30,207 | 30,207 | 69,548 | 73,090 | 77,025 | 50,617 | 86,262 |
| එකතුව | | 35,969 | 47,071 | 47,672 | 71,782 | 88,849 | 92,629 | 65,564 | 88,237 |

### 2.2.2 උසාවි දඩ හා මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.3,391,168 ක් හා මුද්දර ගාස්තු රු.57,952,358 ක් විය. | උසාවි දඩ හා මුද්දර ගාස්තු අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | කුලියාපිටිය මහේස්ත්‍රාත් අධිකරණයේ රෙජිස්ට්‍රාර් විසින් එවා ඇති උසාවි දඩ මුදල් හා ප්‍රධාන ලේකම් කාර්යාලය වෙතින් ඉදිරිපත් කර ඇති උසාවි දඩ අතර නොගැලපීම් පවතින බැවින් 2015 වර්ෂයේ සිට අයකරගැනීමට ඇති උසාවි දඩ මෙතෙක් අයකරගැනීමට නොහැකිවීම සිදුව ඇති බව දන්වමි. |

## 03. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යය සාධනය

ප්‍රාදේශිය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභ සාධනය සඳහා සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

අතුරු ව්‍යවස්ථා

-------------------------

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | ත්‍රී රෝද රථ නැවතුම් පොලවල්, සතිපොළ කටයුතු විධිමත් කිරීම, පවරා නොගත් හා පවරා ගනු ලැබූ සුසාන භූමි හා ආදාහනාගාරය කටයුතු සහ දැන්වීම් පුවරු සම්බන්ධ අතුරු ව්‍යවස්ථා සකස් කිරීමට කටයුතු කර නොතිබුණි. | මෙම කටයුතු විධිමත් කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවීමට කටයුතු කළ යුතුවේ. | සතිපොල කටයුතු විධිමත් කිරිම සඳහා අතුරු ව්‍යවස්ථා සැකසීම වෙනුවෙන් ඉදිරියේදී කටයුතු කරමි. |
| (ii) | නිවාස දේපළ සංවර්ධනයට අදාල අතුරු ව්‍යවස්ථා කඩ කිරීම් සම්බන්ධව නීතිමය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | අතුරු ව්‍යවස්ථාවට අනුව කටයුතු කළ යුතුයි. | නිවාස දේපල ඉදිකිරීම සම්බන්ධයෙන් ගැටළු ඇති වූ අවස්ථාවන්හිදී අදාළ පාර්ශවය හා සාකච්ඡා කර නිවැරදි මිනුම්වලට අනුකූලව සකස් කරන ලෙස උපදෙස් ලබා දී ඇත. |

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

---------------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව විසින් භාවිතා කරන වාහන 02 ක්, ක්‍රීඩාංගනයක් හා පොදු සුසාන භූමි 43 ක් පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | පවරා ගැනීම් සඳහා කටයුතු කළ යුතුවේ. | සිහිකැඳවීම් ලිපි යොමු කරමින් ඉදිරියේදී ඒ සඳහා කටයුතු කරන බව දන්වමි. |

**3.3 මානව සම්පත් කළමනාකරණය**

------------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාවේ අනුමත සේවක සංඛ්‍යාව ඉක්මවා නිලධාරීන් 14 ක් බඳවාගෙන තිබුණි. | කාර්යය මණ්ඩලය සංශෝධනය කර ගැනීමට කටයුතු කළ යුතුවේ. | පළාත් පාලන දෙපාර්තමේන්තුවේ අනුමත කාර්ය මණ්ඩලය අප ආයතනය වෙත අනුයුක්ත කර ඇති බව හා 25/2014 බඳවා ගැනීම් මත |

අතිරික්ත සේවකයින් සිටින බව දන්වමි.

**3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මිහිජය විලේජ් අදියර I හා II ඉඩමට අදාල ඉඩම් කට්ටි සැලැස්ම සභාව විසින් අනුමත කර නොතිබිය දී ඉඩම සංවර්ධනය කර විකිණීම සඳහා සූදානම් කර තිබුණි. | අතුරු ව්‍යවස්ථාවට අනුකූලව කටයුතු කළ යුතුවේ. | අනවසර කාලසීමාව තුළ සංවර්ධන කටයුතු සිදුකරන බව නිරීක්ෂණයවීමෙන් පසු ඒවා වහාම නවතන ලෙස අදාල සමාගම දැනුවත් කර ඇති බව දන්වමි. |

**3.5 නිෂ්ක්‍රිය / ඌණ උපයෝජිත වත්කම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| කැන්දයාය වත්ත සහ අපද්‍රව්‍ය මධ්‍යස්ථාන භූමියට යාබද ඉඩම් කොටස තුළ ආරම්භ කර පවත්වාගෙන යමින් තිබුණු අන්තර් සම්බන්ධිත කුට්ටි ගල් ව්‍යාපෘතිය 2015 වර්ෂයේ සිට අතරමග නවතා දමා තිබුණි. | ඌණ උපයෝජිත වත්කම් ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළ යුතුවේ. | කොන්ක්‍රීට් ගල් ව්‍යාපෘතියේ කටයුතු නැවත ආරම්භ කිරීම සඳහා කටයුතු කරමි. |

**3.6 ප්‍රසම්පාදන**

**ප්‍රසම්පාදන සැලැස්ම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කළ යුතුවේ. | ඉදිරියේදී පිළියෙල කිරිමට කටයුතු කරමි. |

**04. ගිණුම් කටයුතු හා යහපාලනය**

**4.1 අභ්‍යන්තර විගණනය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රමාණවත් පරිදි අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි. | ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකළ යුතුවේ. | අභ්‍යන්තර විගණන කටයුතුවලට අමතරව වෙනත් කටයුතු පවරා ඇති බැවින් නිසි පරිදි අදාළ විගණන කටයුතු සිදු කිරිමට නොහැකි වූ බව දන්වමි. |